මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.01.02

## මාධ්‍ය නිවේදනය

**වයස අවුරුදු 18 ට වැඩි සියළු පුද්ගලයන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම හා ඇතැම් සේවාවන් භාවිතයට ගැනීමේ දී බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම**

2022 දෙසැම්බර් 31 දින වන විට සේවා නියුක්ති ආදායම් ලබන්නන් ද ඇතුළුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටි පුද්ගලයින් සංඛ්‍යාව 250,000 ට ආසන්න ප්‍රමාණයකි. එය අවුරුදු 18 ට වැඩි ජනගහණයේ ප්‍රතිශතයක් ලෙස සියයට 2 කට අඩු අගයකි. මේ අනුව, බදු ගෙවීමට යටත් නමුත් බදු නොගෙවන විශාල පිරිසක් බදු ක්‍රමය තුළ ලියාපදිංචි වී නොමැති බව පෙනීයයි. 2023 මැයි 31 දිනැති අංක 2334/21 දරන ගැසට් නිවේදනය මගින් 2023 ජුනි 01 දින සිට විවිධ වෘත්තිකයන්ද, 2024 ජනවාරි 01 දින සිට වයස අවුරුදු 18 ට වැඩි සියලු පුද්ගලයන්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම අනිවාර්ය කර ඇත. මේ සඳහා වන මාර්ගෝපදේශ දැනටමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති අතර, www.eservices.ird.gov.lk වෙබ් අඩවිය හරහා ඒ පිළිබඳ තොරතුරු බාගත කරගත හැකිය.

කෙසේ වුවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ ලියාපදිංචිව බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් (Tax Identification Number - TIN) ලබාගත් පමණින් පුද්ගලයෙකු ආදායම් බදු ගෙවීමට යටත් නොවේ. යම් පුද්ගලයෙකුගේ ආදායම වාර්ෂික බදු නිදහස් සීමාව වන රුපියල් ලක්ෂ දොළහක් ඉක්මවන්නේ නම්, එම ඉක්මවන ප්‍රමාණයට පමණක් ආදායම් බදු ගෙවීමට යටත් වේ.

මෙම අනිවාර්ය ලියාපදිංචි කිරීමට සමගාමීව 2024 අයවැය මගින් යෝජනා කළ පරිදි ඇතැම් සේවාවන් සපයා ගැනීමේදී බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) ඉදිරිපත් කිරීම ද අනිවාර්ය අවශ්‍යතාවයක් වනු ඇත. මේ අනුව,

- බැංකුවක ජංගම ගිණුමක් විවෘත කිරීම
- ගොඩනැගිලි සැලැස්මක් සඳහා අනුමැතිය ඉල්ලීම
- මෝටර් රථයක් ලියාපදිංචි කිරීම හෝ බලපත්‍රය අළුත් කිරීම
- ඉඩමක් හෝ ඉඩමක හිමිකම ලියාපදිංචි කිරීම

යන අවස්ථාවලදී බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) ඉදිරිපත් කිරීම 2024 පෙබරවාරි 01 වන දින සිට අනිවාර්ය කෙරේ. මේ සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරියේ දී නිකුත් කරනු ඇත.